## රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය

# ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය

## තනතුරු පුරප්පාඩු

රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවත්නා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනයේ පහත තනතුර සඳහා තාවකාලික පදනම මත බඳවා ගැනීමට සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | | |
|---|---|---|
| 01. | **තනතුර** | : **පර්යේෂණ සහකාර (පුරප්පාඩු 04)** |
| | **මාසික දීමනාව** | : **මූලික වැටුප රු. 32,200.00 + ජීවන වියදම් දීමනාව රු. 7,800.00 = රු. 40,000.00** |
| | **අධ්‍යාපන සුදුසුකම්** | : විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන ජාත්‍යන්තර සබඳතා/ සාමය හා ගැටුම් නිරාකරණ අධ්‍යයනය/ ආරක්ෂක අධ්‍යයනය/ බුද්ධි සේවා අධ්‍යයනය/ ත්‍රස්තවාදය/ සමාජ විද්‍යාව/ දේශපාලන විද්‍යාව/ නීතිය/ ආර්ථික විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම. |
| | **පළපුරුද්ද** | : තනතුරට අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ. |
| | **වයස** | : අවු. 18 ට නොඅඩු විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතුයි. |
| | **බඳවා ගැනීමේ ක්‍රමය** | : යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. |

- සියලුම අයදුම්කරුවන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනයේදී ඉංග්‍රීසි භාෂා හැකියාව මැන බැලීම සඳහා විනාඩි 30ක ලිඛිත පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය.
- ඉහත තනතුරුවලට අදාල සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් සිය අයදුම්පත් **2021.12.15** දිනට හෝ ඊට ප්‍රථම **ලේකම්, රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු ය.
- අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු අතර, නියමිත දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බවද දන්වමි.

වැඩිදුර විස්තර සඳහා **www.defence.lk** වෙබ් අඩවියට පිවිසෙන්න.

ලේකම්,

**රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය**

ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,

ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.